// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1950/44 – 2016 ජනවාරි 21 වැනි බ්‍රහස්පතින්දා – 2016.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ නවම්මහර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/වත්/2013/122 සහ 2013.05.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.5040ක් පමණ වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.1020**

උතුරට: ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර, ඇළ සහ ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර; නැගෙනහිරට: ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඇළ; බටහිරට: ඇළ, ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර සහ ඇළ.

02. **කැබලි අක්ෂර 'බී' – කජුගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4020**

උතුරට: කැබලි අක්ෂර ඒ (ඇළ) සහ ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර; නැගෙනහිරට: ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර; දකුණට: ශ්‍රී ලංකා නාවික ගැමුණු බලකා කඳවුර හිමිකම් කියන කජුගහකුඹුර, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කැබලි අක්ෂර ඒ (ඇළ); බටහිරට: ඇළ සහ කැබලි අක්ෂර ඒ (ඇළ).

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2012/ඩී/300.
2016 ජනවාරි මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 168

1A – G 22906 – 12 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*